මාර්තු 12 ව්‍යාපාරයේ මාධ්‍ය නිවේදනය - වසර 2025 ජුනි මස 15 වැනි ඉරුදින, කොළඹදී

# මැතිවරණ ජයග්‍රහණ හැමවිටම ජනතාව සතු විය යුතුය

ව්‍යවස්ථා ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පැවැත්විය යුතුව පැවති ජන්ද විමසීම් අතරින් එක් ජන්ද විමසීමක් හැර අනෙක් සියලු ජන්ද විමසීම් පවත්වා අවසන්ව ඇත. ප්‍රජාතන්ත්‍රීය වටිනාකම් සුරකින රටක් ලෙස එවැනි ප්‍රවේශයක් සඳහා නායකත්වය දුන් දේශපාලන අධිකාරිය කෙරෙහි මාර්තු 12 ව්‍යාපාරයේ ගෞරවය හා ප්‍රශංසාව හිමිය. එබැවින් දැන් අප විමසිය යුත්තේ ජන්ද විමසීම් පවත්වා අවසන නිර්මාණය කල යුතු රටෙහි නිසි ප්‍රතිලාභ පුරවැසියන් ලබන්නේද යන්නයි.

මාර්තු 12 ව්‍යාපාරයෙහි නිරීක්ෂණය වන්නේ දේශපාලන අධිකාරිය හොබවන දේශපාලන නායකයන්ගේ හා මහජන නියෝජිතයන්ගේ දේශපාලන විනය ඉතා ඉහළින් පවත්වා ගැනීම සඳහා ජාතික ජනබලවේග ආණ්ඩුව උපරිම පරිශ්‍රමයක් ගනිමින් සිටින බවයි. ඊට අමතර වශයෙන් මෙතෙක් මෙරටේ බලය හෙබැවූ පූර්වගාමී ආණ්ඩු අන්ධානුකරණයෙන් අනුදත් නාස්තිකාර වියදම් අවම කිරීමේ පිළිවෙතද මහඟු ආරම්භයක් සේ පිළිගත යුතුමය. ඒ කෙරෙහි මාර්තු 12 ව්‍යාපාරයේ ප්‍රණාමය හා සහය ද හිමිය.

පළාත් පාලන ආයතන ජන්ද විමසීම පැවැත්වීමෙන් අනතුරුව එක් දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් පැහැදිළි බහුතරයක් නොලද සභා සඳහා ආයතන ප්‍රධානීන් තෝරාගැනීම උදෙසා පැවැත්වීමට නියමිත හා පැවැත්වෙමින් තිබෙන පළමු සභා රැස්වීම් පිළිබඳව ද මාර්තු 12 ව්‍යාපාරය ලෙස අපි අපගේ බලවත් අවධානය යොමු කොට ඇත්තෙමු.

කොළඹ මහනගර සභාව ප්‍රමුඛ තවත් පළාත් පාලන ආයතන රාශියක් හා සබැඳිව පළවන මාධ්‍ය වාර්තා සහ අදාළ සභිකයන් දෛනිකව පළකරන අදහස් බොහොමයක් සැළකිල්ලෙන් කියැවීමේදී පැහැදිලි වන්නේ යහපත් දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කිරීමට ඇති බලවත්ම බාධාවලින් එකක් වන්නේ මහජන කැමැත්ත දිනාගත් ජනතා නියෝජිතයන්ගේ කුප්‍රකට හා අයෝග්‍ය දේශපාලන චර්යාව බවයි.

සනාත කිරීමට තරම් සාක්ෂි දුලබ වුවද, එක් එක් පාර්ශ්ව වෙත සහය දැක්වීම පිටුපස යම් යම් මූල්‍යමය ප්‍රදාන හා වෙනත් වරප්‍රසාද ද හේතුවක් වී ඇතැයි ජනසමාජය තුළ හුවමාරු වන අදහස් කිසිසේත් ම පළාත් පාලනයේ අනාගතය සුරක්ෂිත නොකරනු ඇත. එය නිසැකවම ජනවරමින් දිනාගත් සභික ධුර වෙන්දේසියේ දැමීමක් බඳු අවරගනයේ දේශපාලන සූදුවක් වන අතර වහසි බස් තෙපලීමෙන් තොරව හා පළාත් පාලනයේ අරමුණ පිළිබඳව නැවත මෙනෙහි කොට, එක් කණ්ඩායමක් ලෙස අදාළ ආයතන සංවර්ධනය කිරීමට එකත්පසව පෙළ ගැසෙන ලෙස තේරීපත්ව ඇති සහ තෝරා පත්කරගෙන ඇති සියලු සභිකයන්ගෙන් සහ දේශපාලන පක්ෂ මෙන්ම ස්වාධීන කණ්ඩායම් වලින් මාර්තු 12 ව්‍යාපාරය ඉල්ලා සිටිනු ලැබේ.

එහෙත් ඉන් පරිබාහිරව පශ්චාත් මැතිවරණ සමයේ අප පුරවැසි සමාජය ලබමින් සිටින ජයග්‍රහණ ඉතා අවම බව පැවසීමට අපි පසුබට නොවෙමු. මෙහි පහත ඉතා සංක්ෂිප්තව දැක්වෙන්නේ ඊට අදාළ නිරීක්ෂණ කිහිපයකි.

01. දේශපාලන අධිකාරියේ අපරිණත හා ආවේගශීලි ප්‍රකාශ නවතා ගත යුතුය - පළාත් පාලන ආයතන ස්ථාපිත කිරීමේ අවස්ථා සඳහා සහභාගී වන දේශපාලන අධිකාරිය තෙපළන ආවේගශීලි හා අපරිණත බස් පුරවැසි සමාජය වික්ෂිප්ත බවට පත් කොට ඇත්තේය. යටත් පිරිසෙන් නව සභිකයන්ගෙන් යුක්තව පළාත් පාලන ආයතන කාර්යයන් අභිනවයෙන් අරඹන අවස්ථා සඳහා අදාළ නියෝජිතයන් හැර ආණ්ඩු පක්ෂය හොබවන දේශපාලන නායකයන් සහභාගී වී පවත්වන ආවේගශීලි සහ ආක්‍රමණශීලි කතා නැවැත්විය යුතුය. එය මෙතෙක් අප නොදුටු ආකාරයේ අහිතකර මැදිහත්වීමකි. පළාත් පාලන ආයතන ක්‍රියාපරිපාටියද උල්ලංඝනය කිරීමකි.

02. ජනමතය සාවද්‍ය ලෙස නිර්වචනය කිරීම- මෙවර පළාත් පාලන ජන්ද විමසීමට එක්වී යම් නියෝජනයක් ලත් බොහෝ දේශපාලන පක්ෂ තමන් ඒ ඒ පළාත් පාලන ආයතනයන්හී එකම ජයග්‍රාහකයන් යැයි හැඟෙන ආකාරයේ සංවාද හා නිර්වචන ජනගත කරමින් සිටින ආකාරය අපි නිරතුරුව නිරීක්ෂණය කරන්නෙමු. එහෙත් ජන්දදායකයන් තම ජන්දය භාවිත කොට ඇත්තේ ඒ ඒ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් වල අනන්‍යතාව කෙරෙහි බලවත් සැළකිල්ලක් යොමු කිරීමෙනි. එබැවින් තමන් වෙත ලැබී ඇති නියෝජනය අදාළ මැතිවරණ ක්‍රමය වන මිශ්‍ර සභික නියෝජන ක්‍රමයේ (MMP) පදනම සේ සැළකෙන කොට්ඨාශ සහ සමානුපාතිකත්වයේ සම්මිශ්‍රණයක් ඔස්සේ ලද්දක් බව අදාළ පාර්ශව සිහි තබා ගැනීම වැදගත්ය. තනි පක්ෂයක් හෝ කණ්ඩායමක් වේවා, සියලු පක්ෂ හා කණ්ඩායම් එක්ව නිර්මාණය කරන සංධානයක් හෝ වේවා අවසානයේදී පළාත් පාලන ආයතනය තුළ කටයුතු කල යුතු වන්නේ එකම කණ්ඩායමක් ලෙසිණි.

03. පවත්නා ක්‍රියාපරිපාටීන් වෙනස් කිරීම පළාත් පාලන ආයතන තුළින් ඇරඹිය හැකිය - 'සිස්ටම් චේන්ජ්'යනු  මෑත කාලීනව ඉමහත් ජනාදරයට පත් සංකල්පයකි. ජාතික ජනබලවේග ආණ්ඩුවේ මැතිවරණ ජයග්‍රහණයේ එක් ප්‍රබල සාධකයක් වූයේද එයයි. එබැවින් වීථි පහන් සවිකිරීම, කැලිකසල බැහැර කිරීම මෙන්ම කුඩා පාලම්-බෝක්කු සකස් කිරීම වැනි අවශ්‍යයෙන්ම පළාත් පාලන ආයතන මඟින් සිදුකල යුතු මූලික කාර්යයන්ට අමතරව වඩාත් නිර්මාණශීලි ප්‍රවේශයක් වෙත සමස්ත පළාත් පාලන පද්ධතිය ම යොමු විය යුතුය. ඒ සඳහා අභිනවයෙන් පත්වන පළාත් පාලන ආයතන ප්‍රධානීන් හට කල හැකි මැදිහත්වීම සුවිශේෂී වේ. තමන්ගේ අදියුරුබව යටතේ පවත්නා පළාත් පාලන ආයතනය ධන උත්පාදන මධ්‍යස්ථාන බවට පත්කිරීමට ඔවුන් සතු බලතල ඉතා ප්‍රමාණවත්ය.  එබැවින් එකී වෙනස සිදුකිරීම සඳහා තමන් ඉදිරිපත් කරන සැළසුම් පළමු සභා රැස්වීමෙන් අනතුරුව ජනගත කරන ලෙස අපි සියලු අභිනව පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටින්නෙමු.

04. වර්තමානයේ දිස්වන පළාත් පාලන ව්‍යූහය නිර්මාණය කොට ඇත්තේ ප්‍රාදේශීය ආණ්ඩුකරණය සඳහා පක්ෂ - විපක්ෂ භේද දුරුකොට සියලු දෙනාගේ ශක්තිය අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රගතිය සඳහා යොදාගත යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමේ අරමුණිනි. එහෙත්  මාර්තු 12 ව්‍යාපාරයේ නිරීක්ෂණය වන්නේ දැනට පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ නායකයන් සහ මන්ත්‍රීවරුන් මෙන්ම අනෙකුත් සම්බන්ධිත පාර්ශව එකිනෙකා කෙරෙහි සතුරු ආකල්පයෙන් කටයුතු කරමින් කෙසේ හෝ බලය ලබාගැනීමේ අරමුණින් පමණක් ක්‍රියාකාරී වෙමින් සිටින බවයි. එබැවින් එක් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කරගන්නා ලෙසත්, ආක්‍රමණශීලි දේශපාලන උපක්‍රම හමුවේ ජනතා උදහසට ලක්නොවන ලෙසත් සියලු තේරීපත්වූ සහ තෝරා පත්කරගන්නා ලද සභිකයන්ගෙන් මාර්තු 12 ව්‍යාපාරය ඉතා කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මෙවැනි කරුණු තවත් බොහෝ මතුකළ හැකිය. එහෙත් ඉහත සිදුවීම් කිහිපය අතරින් මතුවන්නේ ජාතික ජනබලවේග ආණ්ඩුව තමන් තුළම යම් සංවාදයක් ඇරඹිය යුතු බවත් නැවත තම ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් අතර ඇති පරස්පරය වටහා ගත යුතු බවත්ය. ඒ සඳහා සුදුසු නිළධාරීන් තෝරා ගැනීමේ පටන් වත්මන් ආණ්ඩුව සිදුකල යුතුව ඇති ක්‍රියාදාමය එවරස්ට් ගිර තරණය හා සම බව අපි දනිමු. මෙරටේ ජනතාව මේසා විශාල අසහාය බලයක් ජාතික ජනබලවේගය වෙත ප්‍රදානය කරන ලද්දේ ද එවන් ගිරි ශිඛරවලටත් ඔබ්බේ ඇති ඕනෑම ආකාරයක අභියෝගයක් ජයගැනුමට තමන් සමත් බව ඔවුන් ජනතාව වෙත දිව්රා පැවසූ නිසාවෙනි.

එබැවින් දේශපාලන අධිකාරිය හොබවන මහත්වරුණි, තමන්ට වැරදෙමින් ඇත්තේ කොතනද යන්න පිළිබඳ අවංක තක්සේරුවක් සඳහා ඉදිරිපත් වනු මැනවි!!

මාර්තු 12 ව්‍යාපාර මෙහෙයුම් කමිටුව වෙනුවෙන් රෝහණ හෙට්ටිආරච්චි